ආයතනයේ නම : ශ්‍රී ලංකා පොලීසිය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

இலங்கை பொலிஸ்

நிலையியற் கட்டளை இலக்கம் *119(4)* யின் அடிப்படையில் பொதுக் கணக்குகள் குழுவால் பாராளுமன்றத்திற்கு வழங்கப்பட்ட அறிக்கை தொடர்பிலான அவதானிப்புகளையும் மேற்கொள்ளப்பட்ட நடவடிக்கைகளையும் சமர்ப்பித்தல்.

**Name of the institution : Sri Lanka Police**

**Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of the standing order No 119(4)**

# ආයතනයේ නම :- ශ්‍රී ලංකා පොලීසිය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක **119(4)** යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

**රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තා සම්බන්ධයෙන් නිරීක්ෂණ සඳහා ගෙන ඇති පියවරයන් ඉදිරිපත් කිරීම (Parliamentary Series No.183)**

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාව - අංක **183**

ආයතනයේ නම - ශ්‍රී ලංකා පොලිසිය

| කමිටුව විසින් හඳුනාගත් අඩුපාඩු | එකී අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ගත් පියවර / වර්තමාන තත්වය |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | පරිගණක ගත ස්ථාවර වත්කම් වැඩ සටහන යාවත්කාලීන කර පවත්වා ගනී. |
| විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි. | විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා ඇත. |
| මු.රෙ.134(3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. |
| 2016.03.31 දිනැති අංක 5/2016 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2020 වර්ෂයට අදාළව ශ්‍රී ලංකා පොලිසියට අයත් සියළු ස්ථානවල භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. නමුත් රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම් කර තිබූ ආකාරයට සමීක්ෂණ කටයුතු සඳහා නිලධාරීන් යෙදවීමට නොහැකි වූ බැවින් නියමිත දිනට විගණකාධිපති වෙත වාර්තා ඉදිරිපත් කිරීම ප්‍රමාද විය.<br>ප්‍රවර්තන වර්ෂවල භාණ්ඩ සමීක්ෂණය නියමිත දිනට සිදු කර ඇත. |
| වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි. | 2020 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශයන් ක්‍රියාත්මක කර ඇත. |
| වාහනයක් ගර්හිත වී මාස 6කට වඩා අඩු කාලයක දී අපහරණය කර නොතිබුණි. | ශ්‍රී ලංකා පොලිසියට අයත් ධාවනයෙන් ඉවත් කරන ලද වාහන අපහරණය කිරීම සඳහා වාහන ගර්හිත කිරීමේ මණ්ඩලය විසින් නිර්දේශ කර ඇති අතර මිල තක්සේරු මණ්ඩලය ද පත් කර ඇත. අදාළ තක්සේරු මණ්ඩලය විසින් පරීක්ෂා කර තක්සේරු කිරීමෙන් පසු රජයේ ගැසට් පත්‍රයේ පළ කර වෙන්දේසි කිරීමට කටයුතු සිදු කරනු ලැබේ. |
| සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි. | සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා ගෙන ඇත. |

| | |
|---|---|
| බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි. | 2020.12.31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශන වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ හඳුනා ගෙන මේ වන විට නිරවුල් කර ඇත. |
| මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇති කර ගෙන තිබුණි. | මහජනතාවට අවශ්‍ය සේවාවන් සැපයීම, නීතිය හා සාමය අඛණ්ඩව පවත්වා ගෙන යාම වෙනුවෙන් අත්‍යාවශ්‍ය පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් දැරීම සඳහා මු.රෙ.94(1) අනුව ප්‍රතිපාදන ඉක්මවා බැඳීම් ඇති කර ගැනීම සද්භාවයෙන් සිදු කර ඇති අතර එම බැඳීම් ඊළඟ වර්ෂයේ දී නිරවුල් කර ඇත. |
| වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. | 2020.12.31 දිනට රු.63,289,864.44ක් වූ ණය ශේෂයෙන් 2022.12.31 දින වන විට රු.13,532,195.63ක මුදලක් අය කර ගැනීමට කටයුතු කර ඇති අතර රු.49,757,668.81ක් තව දුරටත් අය කර ගත යුතුව ඇත. එම ඉතිරි ණය ශේෂ අයකර ගැනීමේ කටයුතු අඛණ්ඩව සිදුකරමින් පවතී. |
| පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2020.12.31 දිනට වසර 02ක කාලය ඉක්මවා තිබූ තැන්පත් ගිණුමේ ශේෂය රු.236,293,468.94ක් වූ අතර 2022.12.31 දිනට රු.151,500,408.10 දක්වා අඩු කර ඇති අතර ඉතිරි ශේෂ සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කරනු ඇත. |
| රැස් කර තිබුණු ආදායම් නියමිත කාලය තුළ නියමානුකූල ලෙස බැහැර කර නොතිබුණි. | 2020 වර්ෂය තුළ රැස් කර තිබූ සියලු ආදායම් භාණ්ඩාගාරය වෙත බැර කර ඇත. |
| සමාලෝචිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු කාර්ය සාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි. | 2020 වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2020.11.29 දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත. එසේම 2021 කාර්ය සාධන වාර්තාව 2022.10.05 දින ඉදිරිපත් කර ඇත. |
| 2018 අප්‍රේල් 27 දිනැති අංක MSDW/08/65 දරණ චක්‍රලේඛ විධි විධාන අනුව ඉටු කළ යුතු තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා පත් කළ යුතු නියෝජිතයන් දෙදෙනා පිළිබඳව විස්තර අමාත්‍යාංශය වෙත වාර්තා කර නොතිබුණි. | තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා ශ්‍රී ලංකා පොලිසිය වෙනුවෙන් පහත සඳහන් නිලධාරීන් දෙදෙනා මහජන ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් ගේ 2023.03.09 දිනැති PS/04/12/05/388/2023 ලිපියෙන් පත් කර ඇත.<br><br>නියෝජ්‍ය පොලිස්පති/ අසංග කරවිට මහතා<br>ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී/ ලලිත් ඇතුලත්මුදලි මහතා |
| රාජ්‍ය පරිපාලන විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2020 වර්ෂයේ දි පිළියෙළ කර අවසන් කල ද එම වර්ෂයේ මැයි මාසයේ සිට පැවති Covid – 19 වසංගත තත්ත්වය හේතුවෙන් එම සැලසුම් අනුව ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නොතිබුණි.<br>2020 සහ 2021 වර්ෂවල දි මානව සම්පත් සංවර්ධන සැලැස්ම නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට Covid – 19 වසංගත තත්ත්වය බලපෑ අතරම 2022 වර්ෂයේ දී රට තුළ පැවති අරගල තත්ත්වය හේතුවෙන් පූර්ව සැලසුම් වලට පරිබාහිරව නිලධාරීන් රාජකාරි යෙදවීමට සිදුවීම හේතුවෙන් මානව සම්පත් සංවර්ධන සැලැස්මේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට නොහැකි විය. රාජ්‍ය පරිපාලන විධිවිධාන අනුව ඉදිරි වර්ෂ 02 සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්ම යථාවත් කිරීමේ කටයුතු දැනටමත් ආරම්භ කර ඇත. |

| | |
|---|---|
| සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් එක් සේවකයකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12ක අවම පුහුණුවක් නියම කර නොතිබුණි. | ශ්‍රී ලංකා පොලිසියේ නිලතල ව්‍යුහය අනුව විධායක ශ්‍රේණියේ හා මාණ්ඩලික නිලධරයන්ගේ පුහුණුව ජාතික පොලිස් අභ්‍යාස ආයතනය වෙත පවරා ඇති අතර, 2023 වර්ෂයේ දී සෑම විධායක හා මාණ්ඩලික නිලධාරියකුටම අවම වශයෙන් සතියක පුහුණු පාඨමාලාවක් සඳහා සහභාගී කරවීමට පුහුණු සැලසුම් අනුමත කර මේ වන විට ක්‍රියාත්මක කරමින් පවතියි.<br><br>මාණ්ඩලික නොවන තනතුරුවලට අයත් නිලධරයන්ගේ පුහුණු කටයුතු සේවස්ථ පුහුණු කොට්ඨාසය මගින් සිදු කරමින් පවතින අතර, සේවස්ථ පුහුණු කොට්ඨාසයේ පුහුණු ඒකක 14ක් සක්‍රියව ක්‍රියාත්මක කරමින් 2023 වර්ෂයේ දී 73,000ක් පමණ වන සක්‍රිය සේවයේ සිටින මාණ්ඩලික නොවන නිලධරයන් හට අවම වශයෙන් සතියක කාලයක් සඳහා පුහුණු සැලසුම් සකස් කර ක්‍රියාත්මක කරමින් පවතියි.<br><br>එයට අමතරව ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලය සහ ඒකක 07ක් මගින් නිලධරයන්ගේ ආධුනික පුහුණුව සිදු කිරීමට අමතරව උසස් වීම් ලද නිලධරයන් 26,000ක් සඳහා තනතුරට හැඩ ගැස්වීමේ පුහුණු පාඨමාලා ආරම්භ කර ඇති අතර, මේ වන විට 40%ක් පමණ ක්‍රියාත්මක කර අවසන් කර ඇත. |
| සමස්ත කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි. | ශ්‍රී ලංකා පොලිසියේ සියළුම විධායක ශ්‍රේණියේ සහ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් සඳහා කාර්ය සාධන ගිවිසුම් සකස් කර දැනටමත් ක්‍රියාත්මක කරනු ලබයි. |
| විගණකාධිපතිවරයා විසින් ඡේදවලින් පෙන්වා දී තිබූ අඩුපාඩු/ දෝෂ නිවැරදි කරවාගෙන නොතිබුණි. | විගණකාධිපතිවරයා විසින් ඡේදවලින් පෙන්වා දී තිබූ අඩුපාඩු/ දෝෂ නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇත. |

ටිරාන් අලස් (පා.ම.)
මහජන ආරක්ෂක අමාත්‍ය